# බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රචණ්ඩත්වය

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් කෙතරම් වෙන් කිරීමට තැත් කළ ද, විවිධ ක්ෂේත්‍ර අතර බැඳීමක් ඇති බව අපි පුන පුනා කියමු. ඒ හේතුවෙන් ම බටහිර සාහිත්‍යය කෙතරම් ආගමෙන් වෙන් කෙරී ඇතැයි කීව ද, ඒවා අතර සම්බන්ධයක් වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි නිර්මාණය කෙරෙන කලා කෘති මගින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආගම වූ කතෝලික නො වන ක්‍රිස්තියානි ආගමක පණිවුඩයක් සමාජයට ලැබීම වැළැක්විය හැකි නො වෙයි. මේ නව ක්‍රිස්තියානි ආගම පසුගිය අවුරුදු පන් සියයක පමණ කාලයක විකාශනය වී ඇත. මාටින් ලූතර්, කැල්වින් ආදී පූජකවරුන් විසින් අරඹන ලද ගමන් මගෙහි ඒ ක්‍රිස්තියානි ආගම පරිණාමය වෙයි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පරස්පර විරෝධී අදහස් වෙයි. ඒ එක් පැත්තකින් වාස්තවිකත්වය මත පදනම් වෙයි. එහි යථාර්ථයක් ගැන කියැවෙයි. ඒ ඌනිතවාදී වෙයි. මනස භෞතිකයට ඌනනය කිරීමට උත්සාහයක් ගැනෙයි. ඒ අතර මිනිසාගේ වගකීමක් ගැන සඳහන් කරයි. තවත් පැත්තකින් ගත් කල බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි විවිධ ක්ෂේත්‍ර එකිනෙකින් වෙන් කිරීමට උත්සාහ ගැනෙයි. එහෙත් ඒ අතර ම ඒ ඒ ක්ෂේත්‍ර චින්තනය, එනම් මෙහි දී බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය, ඔස්සේ එකිනෙක සමග බැඳී පවතියි. බටහිරයන් පසුගිය අවුරුදු පන් සියයක පමණ කාලයක් මුළුල්ලෙහි කෙතරම් දැනුම් සම්භාරයක් ගොඩනගාගත්ත ද, එහි අත්තිවාරම එතරම් ශක්තිමත් නො වෙයි. එහි පරස්පර වෙයි.

බටහිර සාහිත්‍යයෙන් හා අනෙකුත් කලාවන්ගෙන් පණිවුඩයක් නො දියයුතු යැයි බටහිර සාහිත්‍ය විචාරකයන් හා සෙසු කලා විචාරකයන් කෙතරම් කෑමොර ගැසුව ද ඒ කෘතිවලින් අවිඥානික ව හෝ පණිවුඩයක් දීම නොවැළැක්විය හැකි වෙයි. එක් පැත්තකින් බටහිර කලාවෙහි තැත් කෙරෙන්නේ ඊනියා යථාර්ථය නිරූපණය කිරීමක් යැයි කියැවෙයි. අද ෆැන්ටසිය නමින් හැඳින්වෙන්නෙන් ද අවසාන වශයෙන් කෙරෙන්නේ ඊනියා යථාර්ථය නිරූපණය කිරීමක් යැයි බටහිර උගත්තු කියති. අද සමාජයට මේ යථාර්ථය පිළිබඳ අදහස කාන්දු වී ඇත. පණිවුඩ නො දියයුතු යැයි කොපමණ ප්‍රකාශ කළ ද, කලාව හා කලා විචාරය ඔස්සේ පණිවුඩ යැම නොවැළැක්විය හැකි ය.

සාහිත්‍යයෙන් පිළිබිඹු වන්නේ ඊනියා යථාර්ථය නම් අපට ඒ ගැන කළ හැක්කේ කුමක් ද යන පණිවුඩය ද සමාජයට යයි. අප කලා කෘතියක් නැරඹීමෙන් අප නොදැනුවත් ව ම (අවිඥානික ව) ලබන පණිවුඩයක් වෙයි. ඒ පණිවුඩය නම් අපට මේ පිළිබිඹු වන යථාර්ථය වෙනස් කිරීමට නොහැකි බවත්, අප තවමත් ඒ ඊනියා යථාර්ථයට පටහැණි චරිත සහිත වේ නම් යම්කිසි වරදක් ඇති බවත් ය. මිනිසුන්ට එවැනි හැඟීමක් ලැබෙන්නේ ඒ පිළිබඳ කෙරෙන විශ්ලේෂණයකින් පසුව නො වෙයි. මිනිස්සු අවිඥානිකව ම එවැනි පණිවුඩ ලබති. බටහිරයන් කලාවෙන් පණිවුඩ නො දියයුතු යැයි කෙතරම් කෑ ගැසුව ද, එවැනි මූලික පණිවුඩ සමාජයට යැවීම පිළිබඳව ඔවුනට කළ හැකි දෙයක් නැත.

පණිවුඩ යැවීම, ලැබීම පිළිබඳ ඊනියා විද්‍යාවක් ද බටහිරයන් සතු වෙයි. අද ඇතැමුන් කතා කරන සංඥාවේදය (semiotics) යන්න කලාකෘතිවලට ම යෙදීමට ඔවුන් නො පෙලඹෙන්නේ ඇයි? ඇතැමුන් කියනු ඇත්තේ සංඥාවේදය යොදාගන්නේ සවිඥානික ක්‍රියාවලියකට බව ය. උදාහරණයක් ලෙස ගත හොත් ටෙලිනාට්‍යයක් නරඹන විට අපට එහි චරිත ඒ ඒ ආකාරයෙන් හැසිරෙනු දැකගත හැක්කේ ඒ නැරඹීමේ දී ලැබෙන සංඥාවලින් අප යම් යම් අර්ථකථන, තේරුම් ලබාගන්නා බැවින් ය. ඒ ක්‍රියාවලිය සවිඥානික ය. ගම්පෙරළිය චිත්‍රපටියෙහි නන්දා ලෙස රඟපාන නිළිය අප ඇස ගැටෙන විට ඒ නන්දා යැයි අපි තේරුම් ගන්නෙමු.

එහෙත් එයට අමතර ව අවිඥානික ව ක්‍රියාවලි රාශියක් ඇති වීමට ඉඩ ඇත. කුඩා දරුවනට ප්‍රචණ්ඩත්වය ආදිය නිරූපණය වන චිත්‍රපටි නො පෙන්විය යුතු බවට සමාජයේ මතයක් වෙයි. එයට හේතුව කුමක් ද? ප්‍රචණ්ඩත්වය නිරූපණය වන චිත්‍රපටියක් නැරඹීමෙන් දරුවා හිංසා කරන හා ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන චරිත දැනගැනීම හැරෙන්නට ප්‍රචණ්ඩත්වය පිළිබඳව ද යමක් චිත්‍රපටියෙන් ඉගෙන ගනියි. එයට අමතරව, ප්‍රචණ්ඩත්වය හොඳ ද නරක

© Prof. Nalin De Silva

ද යන ප්‍රශ්නය ද දරුවාගේ සිතට ඒමට ඉඩ ඇත. එසේත් නැත හොත් ඒ ප්‍රශ්නය නගනු වෙනුවට චිත්‍රපටියෙන් පෙන්වන ප්‍රචණ්ඩත්වය අනුකරණය කිරීමට දරුවාට සිතෙනු ඇත.

දරුවා චිත්‍රපටියෙන් නිරූපණය කෙරෙන තවත් දේ අතර ප්‍රචණ්ඩත්වය ද දකියි. ඒ අනෙක් දෑ සාමාන්‍යයෙන් ගෙදර දොරේ සිදුවන දෑ නම් ප්‍රචණ්ඩත්වය ද ගෙදර නො සිදුවුවත් ලෝකයේ සිදු වන ක්‍රියාවක් ලෙස දරුවා දකියි. දරුවෝ තමන් අසන දකින දෑ අනුකරණය කරති. එබැවින් දරුවන් ප්‍රචණ්ඩත්වය ද අනුකරණය කිරීමට පෙලඹෙනු ඇත. චිත්‍රපටියෙන්, ටෙලිනාට්‍යයෙන් ප්‍රචණ්ඩත්වය නිරූපණය කෙරෙන දර්ශන දරුවන්ට ප්‍රදර්ශනය කරන විට ඉවත් කළ යුතු යැයි සාමාන්‍යයෙන් කියැවෙන්නේ එබැවිනි.

චිත්‍රපටියෙන් හෝ ටෙලිනාට්‍යයෙන් හෝ ප්‍රචණ්ඩත්වය දකින දරුවා ඒ අනුකරණය කිරීමෙන් වළක්වාගත හැකි ක්‍රමයක් ද වෙයි. එනම් එවැනි දර්ශන සමග එහි ආදීනව ද දැක්වීමෙන් හා එයට විරුද්ධ ව කරුණු කියා දීමෙන් ය. සමාජයේ හොඳ නරක කියා දෙයක් ඇති බව ද මේ මේ දෑ හොඳ යැයි ද, මේ මේ දෑ නරක යැයි ද අපි දරුවනට කියා දෙමු. හොඳ නරක තීරණය වන්නේ ඒ ඒ සමාජයට සාපේක්ෂ ව බව මෙහි දී අමුතුවෙන් කිව යුතු නැත. එක් සමාජයක හොඳ යැයි පිළිගැනෙන දෙයක් වෙනත් සමාජයක නරකක් ලෙස දැකීමට ඉඩ තිබේ.

කලා කෘතියෙහි නෛසර්ගික ව හොඳ නරක දැන ගැනීමේ ක්‍රමයක් නැත්නම් වෙනත් මාර්ගයකින් හෝ හොඳ නරක දරුවනට කියා දිය යුතු බවට අපේ සාමාන්‍යයෙන් එකඟත්වයක් ඇත. එහෙත් අවාසනාවකට දරුවන් නරඹන සෑම ටෙලිනාට්‍යයක් ම ඔවුන් සමග නරඹා මේ මේ දේ හොඳ යැයි ද මේ මේ දේ නරක යැයි දැනමුතුකම් දීමේ අවස්ථාව අපට නොමැත. එබැවින් සමස්තයක් ලෙස ගත් කල දරුවන් නරඹන චිත්‍රපටිවලින් ටෙලිනාට්‍යවලින් ප්‍රචණ්ඩත්වය වැනි දේ ඉවත් කළ යුතු යැයි සමාජයෙහි පිළිගැනීමක් ඇත.

එහෙත් මේ පිළිගැනීම අත්තේ අප අද ජීවත්වන සමාජයෙහි නො ව මෙයට ටික කලකට පෙර අප ජීවත් වූ සමාජයෙහි ය යන්න අපට අමතක වන කරුණකි. විශේෂයෙන් ම අද බටහිර රටවල ඒ පිළිගැනීම නාමික වූවක් බවට පත් වී ඇත. කලින් එවැනි පිළිගැනීමක් තිබුණු බැවින් පුරුද්දට මෙන් ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණ ආදිය නිරූපණය කරන දර්ශන දරුවනට නො පෙන්වියයුතු යැයි කීව ද, එවැනි දර්ශන තහංචියකින් තොර ව මෙන් වර්තමානයේ බටහිර රටවල දරුවනට ප්‍රදර්ශනය කෙරෙයි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ බටහිර රටවල දරුවන් අතින් කෙරෙන අපරාධ සංඛ්‍යාව ඉහළ ගොස් තිබීම ය. අපේ රටෙහි ඒ තත්ත්වය තවමත් උදා වී නැති වුවත් ඒ ප්‍රවනතාව දක්නට ඇත.

මෙරට පඬියන් මේ තත්ත්වයට හේතුව යුද්ධය යැයි කියා එක් පැත්තකින් ඇඟ බේරාගැනීමටත් අනෙක් පැත්තෙන් කෝටි සංවිධානය ආරක්ෂා කරගැනීමටත් ඉදිරිපත් වනු ඇත. එහෙත් මොවුන් යුද්ධය යැයි හඳුන්වන ක්‍රියාවලිය තාවකාලික එකක් බවත්, එය සාමාන්‍යය නො වන බවත්, කෝටි පැරදවීම සඳහා ඒ අවශ්‍ය බවත් දරුවනට කියා දීම අමාරු කාර්යයක් නො වෙයි. එහෙත් සාමාන්‍ය ජීවිතයේ දී ප්‍රචණ්ඩත්වය දැක්වෙන ටෙලිනාට්‍ය හා චිත්‍රපටි ප්‍රදර්ශනය කිරීමෙන් දරුවනට වෙනත් පණිවුඩයක් ලැබෙන බව මේ පඬියෝ ඔවුන්ට බොහෝ විට රාජ්‍ය නො වන සංවිධානවලින් ලැබෙන වැටුපට හා වෙනත් දීමනාවලට ගිජුවීමෙන් නො දකිති.

දැනට දශක කිහිපයකට පෙර පැවති සමාජ අද බටහිර ද මෙරට ද දක්නට නැත. මේ සමාජ විකාශනය සිදුවන්නේ බටහිර ක්‍රිස්තියානි නූනත්වය යටතෙහි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් වෙන් කිරීමේ ක්‍රියාවලිය වර්ධනය කෙරී අද සමාජය, විශේෂයෙන් බටහිර සමාජය පරමාණුකරණයට (atomization) ලක් වී ඇත. අද දරුවන් මවුපියන්ගෙන් වෙන් කෙරී ඇත. දරුවන්ට ඊනියා ස්වාධීනත්වයක් තිබිය යුතු යැයි අපේක්ෂා කෙරෙයි. මේ ස්වාධීනත්වය, නැත්නම් පෞද්ගලිකත්වය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අත්‍යවශ්‍ය වෙයි. බටහිර ක්‍රිස්තියානි ආගම ඒ ආකල්පවලට අනුරූප ව විකාශනය වනු ද අපට දැකගත හැකි ය.

අවුරුදු පන් සියයක පමණ විකාශනයකින් පසුව අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යම් ස්ථානයකට පැමිණ ඇත. ඒ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස මතුපිටින් කලා කෘති ආගමෙන් වෙන් කෙරී ඇත. එහෙත් කලා කෘතිවලින් ද ආගමෙන්

© Prof. Nalin De Silva

ද කියැවෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය දේ ය. අද ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එහි ආරම්භයෙහි දී මෙන් ම ප්‍රචණ්ඩත්වය අවශ්‍ය වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අරම්භයෙහි දී ලොව ප්‍රචලිත වූයේ ප්‍රචණ්ඩත්වය උපයෝගී කරගෙන බව ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ඇත්තෝ දනිති. එකල වැඩිහිටියන්ට ප්‍රචණ්ඩත්වය අවශ්‍ය වුව ද දරුවන්ගෙන් ප්‍රචණ්ඩත්වය ඉවත් විය යුතු ය යන හැඟීමක් බටහිර තිබෙන්නට ඇත.

දරුවන්ගෙන් ප්‍රචණ්ඩත්වය ඉවත් විය යුතු ය යන්නෙන් දරුවන්ට කරන හිංසා නැති විය යුතු ය යන අදහසක් නො තිබූ බව අමතක නො කළ යුතු ය. දරුවන් වහල් සේවයේ යෙදවීම මෙන් ම දරුවන්ගෙන් අමානුෂික ලෙස වැඩගැනීම ද බටහිර සමාජයෙහි දක්නට ලැබුණි. එහෙත් දරුවනට කරන හිංසා බටහිර ක්‍රිස්තියානි නූතත්වයෙහි පරිණාමයත් සමග යම් ප්‍රමාණයකට අහෝසි වී ඇත. එයට ප්‍රධාන හේතුව දරුවනට ද ස්වාධීනත්වයක් හා පෞද්ගලිකත්වයක් ඇතැයි ආදී සංකල්ප ය. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ප්‍රචණ්ඩත්වය අවශ්‍ය වෙයි. අද එය දරුවනට ද හිමි කිරීම දක්වා විකාශනය වී ඇත. එහෙත් මවුපියෝ තවමත් තමන් ඇති දැඩි වූ සමාජයේ තිබූ ආකල්ප හිසින් දරාගෙන සිටිති. එබැවින් දශක කිහිපයකට ඉහතින් වූ අයුරින් දරුවනට ප්‍රචණ්ඩත්වය නුසුදුසු යැයි මවුපියෝ සිතති. එහෙත් මවුපියන්ට අවශ්‍ය නැති වුව ද අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දරුවනට ප්‍රචණ්ඩත්වය අවශ්‍ය වෙයි.

බටහිරයන් අද පැටලී අත්තේ පඹගාලක ය. මේ පඹගාලෙන් එළියට එන මඟක් ඇත්තේ බෞද්ධ සංස්කෘතිවල ය. එබැවින් ම අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය බෞද්ධ සංස්කෘතිවලට තදින් පහර දෙනු දැකිය හැකි ය. විශේෂයෙන් ම ථෙරවාදී බෞද්ධ සංස්කෘතීන්ට පහර දීමට බටහිරයෝ විශාල ධනයක් වැය කරති. අප රටේ සිටින රාජ්‍ය නො වන සංවිධානවල බටහිරින් වැටුප් ලබන උගතුන්ගේ ප්‍රධාන කාර්යභාරය වී ඇත්තේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට පහර ගැසීමත්, කලා කෘති මගින් සිංහල සංස්කෘතිය හැකි නම් අඩපණ කර ඒ මත බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ස්ථාපනය කිරීමත් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva